අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/3/2-I

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2022.05. 09

**චක්‍රලේඛ අංකය - 22 / 2022**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ.වරුන්,

සියලුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්,

රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## සමස්ත ලංකා පාසල් කර්ණාටක සංගීත තරගය සහ මුස්ලිම් සිසුන් සඳහා විශේෂ තරග චක්‍රලේඛය - 2022

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාවෙන් වාර්ෂිකව පවත්වනු ලබන උක්ත තරගය 2022 වර්ෂයේ ද පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. මේ සම්බන්ධයෙන් ඔබ පළාතේ/ කලාපයේ / කොට්ඨාසයේ /විදුහලේ, අදාල ගුරු භවතුන් සහ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් දැනුවත් කර, මෙම තරගයට ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කිරීමට අදාල කටයුතු සිදු කරන ලෙස දන්වමි.

### හැඳින්වීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව විසින් වාර්ෂිකව පවත්වනු ලබන මෙම තරගය මගින් ශිෂ්‍යයින්ගේ සංගීත කුසලතා වර්ධනය වැඩි දියුණු කරනු ලැබේ. මෙම තරගයෙන් ජය ලබන සිසුන්හට උසස් අධ්‍යාපනයේ දී ප්‍රමුඛස්ථානය හිමිවේ.

### තරගයේ අරමුණ

සිසුන්ගේ සංගීත ප්‍රායෝගික නිර්මාණාත්මක හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් මෙම තරගය පවත්වනු ලැබේ.

## තරගය පිළිබඳ පොදු නීති රීති

### 1. 01. තරග අංශ

1. ජ්‍යෙෂ්ඨ 1 කොටස - 10 සිට 11 ශ්‍රේණි දක්වා
2. ජ්‍යෂ්ඨ 2 කොටස - 12 සිට 13 ශ්‍රේණි දක්වා
3. විවෘත කොටස - 10 සිට 13 ශ්‍රේණි දක්වා

**1.02. සහභාගීවන පාසල් ප්‍රධාන කොටස් තුනකට බෙදනු ලැබේ. ඒ පිළිබඳව තරග ශීර්ෂ යටතේ උපදෙස් ලබා දී ඇත. ඒ අනුව අදාල පාසල් තරග සඳහා අයදුම් කළ යුතුවේ.**

1. ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල්
2. ශිෂ්‍ය සංඛ්‍යාව 301-1000 අතර පාසල්
3. ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල්

### 02. සහභාගිත්වය

2.1 රජයේ පාසල්වල සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සිසු / සිසුවියන්ට මෙම තරගයට සහභාගි විය හැකිය.

2.2 සහාය වාදනය සඳහා අදාල පාසලේ සිසුන් සහභාගිකර ගත හැක. වාදනය කළ හැකි සිසුන් අදාල පාසලේ නොමැති විටකදී එම පළාතට අයත් වෙනත් පාසලක සිසුන් සහ ගුරුවරුන් සහභාගීකර ගත හැකිය.

2.3 සහාය වාදනය සඳහා තෝරාගනු ලබන සිසුන්ට තරග ශීර්ෂවලට අදාළ වයස් සීමාව අවධානයට ලක් නොකෙරේ.

2.4 කිසිදු තරග අවස්ථාවකදී පෞද්ගලික පාසල් ගුරුවරුන් හෝ කලාකරුවන්ට සහාය වාදකයින් ලෙස සහභාගි විය නොහැකිය.

2.5 මෙම තරගය සඳහා එක් පාසලකින් 10 සිට 13 ශ්‍රේණිය දක්වා සිසු / සිසුවියන්ට සහභාගිවිය හැකිය. එමෙන්ම දෙවන වරට 2022 වර්ෂයේ උසස් පෙළ සඳහා පෙනී සිටින සිසු / සිසුවියන්ට ද සහභාගිවිය හැකිය.

2.6 එක් පාසලකට තරග අවස්ථාවන් 03 කට ( තුනකට) පමණක් සහභාගි විය හැකිය.

2.7 මෙම තරගය සඳහා නිර්මාණය කරනු ලබන ගී පදමාලා ආදිය ජාති. ආගම්, කුල භේදවලට හෝ පටු දේශපාලනික අදහස් වලට තුඩු නොදෙන පාසල් සිසුන්ට උචිත ඒවා විය යුතු ය.

2.8 තරගයට ඉදිරිපත් වීමට පෙර ස්වතන්ත්‍ර නිර්මාණය කර ඇති ගීත ඇත්නම් එම පිටපත් විනිශ්චය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

2.09 කලාප, පළාත් තරගවලදී සුවිශේෂී ඇඳුම් හා වස්ත්‍රාභරණ සමඟ සහභාගි නොවී පාසල් නිල ඇඳුමින් සහභාගිවීම අනිවාර්ය වේ.

2.10 ජාතික මට්ටමේ තරගවලදී උචිත ප්‍රාසාංගික ඇඳුම් පැළඳුම් සහිතව සහභාගි විය හැකිය.

2.11 මෙම ඇඳුම් පාසල් පද්ධතියට උචිත විය යුතු අතර, ඒ පිළිබඳ පූර්ණ වගකීම පාසල් විදුහල්පතිවරයා සහ විෂය භාර ගුරුවරයා සතුවේ.

2.12 අවසාන තරගයේ, තරග කාලසටහන අනුව සහභාගි නොවන තරගකරුවන් එම තරගයට ඉදිරිපත් නොවන්නාසේ සලකා ප්‍රතිඵල ලබාදීම සිදු කෙරේ.

## 03. තරග සංවිධානය

3.1 මෙම තරගය කලාප මට්ටමින්, පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් යනුවෙන් අවස්ථාවන් තුනකදී පැවැත්වේ.

3.2 කලාප තරග අදාල කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සංවිධානය කළ යුතු අතර ඔහු තරගයෙහි අවසාන තීරකයා ද වේ.

3.3 පළාත් තරගවල පූර්ණ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට පැවරෙන අතර, මෙම චක්‍රලේඛයට අනුකූලව අවසන් තීරණ ගැනීමේ බලය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා සතුවේ.

3.4 කලාප තරග පවත්වා එහි ප්‍රතිඵල පළාත් තරග සංවිධාන සඳහා අදාල දිනයට ප්‍රථම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට යැවිය යුතුය.

3.5 කලාප මට්ටමේ තරගවලට සහභාගිවූ ශිෂ්‍යයින්ම ජාතික මට්ටමේ තරග සඳහා ද සහභාගි විය යුතු ය.

3.6 තරග අවස්ථාවකට සහභාගිවන තරගකරුවන් ප්‍රථමයෙන් සහභාගිවන පාසල වෙනුවෙන් අඛණ්ඩව පවත්වනු ලබන තරග අවස්ථා වලට ද සහභාගි විය යුතු ය. (වෙනත් පාසලකට මාරුවූ අවස්ථාවන්හි දී ද ඉහත සඳහන් කරුණ අදාල වේ.)

3.7 පළාත් තරග ප්‍රතිඵල අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) වෙත ලියාපදිංචි තැපැලෙන් අදාල දිනට පෙර එවිය යුතු ය.

3.8 කලාප සහ පළාත් තරග අවස්ථාවලදී සමස්ථාන ලබා නොදිය යුතුය. අවසාන තරගය සඳහා ද, පළාත් මට්ටමින් ප්‍රථම ස්ථානය දිනාගත් පාසල් වලට පමණක් කැඳවීම් කරනු ලැබේ.

## 04. වෙනත් උපදෙස්

4.1 අදාල කලාපයේ පිහිටි පාසල් තරගය සඳහා සහභාගිකරවා ගැනීම ඒ ඒ කලාපවල සෞන්දර්ය විෂයය භාර අධ්‍යක්ෂවරයාගේ සහ අදාල පාසලේ විදුහල්පතිවරයාගේ වගකීම වේ.

4.2 තරගය සඳහා අයදුම් කිරීමේ දී නියමිත ඉල්ලුම්පත්‍රයට අනුකූලව සකස් කර අයදුම් කළ යුතු ය.

4.3 අදාල තරග ශීර්ෂ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සනින් යුතුව මෙම චක්‍රලේඛයට අමුණා ඉදිරිපත් කරනු ලැබේ.

සටහන - තරගයේ දී ඉලෙක්ට්‍රෝනික තාම්පුරා, ඉලෙක්ට්‍රෝනික ඍෘති යනාදි උපකරණ හැර, වෙනත් ඉලෙක්ට්‍රෝනික සංගීත උපකරණ භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් වේ.

## 05. සහතිකපත් පිරිනැමීම

5.1 කලාප සහ පළාත් මට්ටමින් ජයග්‍රහණය කරනු ලබන සිසු/සිසුවියන්ට සහතික පත් ලබාදීම අදාල කලාප/පළාත් මගින් සිදුකල යුතු ය.

5.2 ජාතික මට්ටමින් ජයග්‍රහණය කරනු ලබන සිසු / සිසුවියන්ට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සහතිකපත් පිරිනමනු ලැබේ.

5.3 මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලුම තරග කරුවන් හා අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවක දීම මෙම තරග චක්‍රලේඛයේ සඳහන් සියලුම නීති රීති පිළිපැදීමටත්, විනිශ්වය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය. සමස්ත ලංකා මට්ටමෙහි අවසාන තරගයට ඉදිරිපත්වන පාසල් සඳහා ලබා දෙන තරග කාලසටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශනය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් නියමිත ස්ථානයෙහි අත්සන් යොදා තරගයට ඉදිරිපත් විය යුතු ය. මෙම චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට හෝ පටහැනිව කටයුතු කර ඇති බව අනාවරණය වුවහොත් තරගයේ කුමන අවස්ථාවකදී වුවද ප්‍රතිඵල ලේඛන වලින් එම විදුහල ඉවත් කිරීම, විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාළ වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතුවේ.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය